# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 OCTOBER Issue No. 11


## ශුද්ධවූ බයිබලය

**(යොහාන් 1:1-10)**

01. පටන්ගැන්මෙහිදී වාක්‍යාණෝ සිටිසේක, වාක්‍යාණෝ දෙවියන්වහන්සේ හා සමඟ සිටිසේක, වාක්‍යාණෝ දෙවියන්වහන්සේව සිටිසේක.

02. උන්වහන්සේ පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ සමඟ සිටිසේක.

03. උන්වහන්සේ කරුණාකොටගෙන සියල්ල සාදනලද්දේය, සාදනලද කිසිවක් උන්වහන්සේ නැතුව සාදනු නොලද්දේය.

04. උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය. ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ අලෝකය වූයේය.

05. අලෝකය අන්ධකාරයෙහි බබළයි. අන්ධකාරයද එය ග්‍රහණය නොකළේය.

06. දෙවියන්වහන්සේ වෙතින් එවන ලද යොහාන් නම් මනුෂ්‍යයෙක් ආවේය.

07. ඔහු කරණකොටගෙන සියල්ලන් විසින් අදහන පිණිස ආලෝකය ගැන සාක්ෂිදෙන්ට ඔහු සාක්ෂි පිණිස ආවේය.

08. ඔහු ඒ ආලෝකය නොව ඒ ආලෝකය ගැන සාක්ෂිදෙන පිණිස ආ තැනැත්තේය.

09. ලෝකයට එන්නාවූ සියලු මනුෂ්‍යයන් ආලෝක කරන්නාවූ ආලෝකය සත්‍යය වූ ආලෝකයය.

10. උන්වහන්සේ ලෝකයෙහි සිටිසේක, ලෝකයද උන්වහන්සේ කරුණකොටගෙන සාදනලද්දේය. නුමුත් ලෝකයා උන්වහන්සේ ඇඳින ගත්තේ නැත.

# ඔබ බැබළීමට කැඳවා ඇත !

YOU ARE CALLED TO SHINE! (සහෝදරී ඇන්ජලින්)



අපගේ ස්වාමීන් සහ ගැලවුම්කාරවූ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ නාමයෙන් මාගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ පවුලේ අයටත් සුභ පතමි!

ඉන්දියාවෙහි දීපවාලී මාසය ඉතා සුවිශේෂී කාලයකි. රට පුරා සහ ලොව පුරා මිලියන සංඛ්‍යාත ජනතාවක් ආලෝක උත්සවය සමරති. සම්ප්‍රදායිකව අන්ධකාරය පරාජය කරමින් ආලෝකයේ ජයග්‍රහණය සමඟ සම්බන්ධ වූ උත්සවයකි.

ලොව පුරා සිටින ඉන්දියානුවන් දීපවාලී සමරනු දකින සෑම විටම මට ඊටත් වඩා ශ්‍රේෂ්ඨ ආලෝකයක් ගැන සිතීමට නොහැකිය. ලෝකයේ ආලෝකය වන ස්වාමිවූ ගැලවුම්කාර යේසුස්වහන්සේ උන්වහන්සේ අපගේ ඇස් ඇරීමට, බලාපොරොත්තු රහිත අය තුළ බලාපොරොත්තුව අවදි කිරීමට සහ අන්ධකාරයෙන් උන්වහන්සේගේ පුදුමාකාර ආලෝකයට අපව ගෙන යාමට අපගේ අන්ධකාරයට පිවිසියේය.

**ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය අන්ධකාරයට ඇතුළු වූ විට!**

දෙවියන්වහන්සේ මැවීමේදී කතා කළ පළමුව වචන වූයේ: *"එළිය වේවායි ......"* *(උත්පත්ති 1:3)*

3 වෙනි පිටුවට ...


**Echo of His Call**

*Christian YouTube Channel!*



Every day 2 minutes message by

**Pr. S. Sam Selva Raj!**

in English, Hindi Language - 1.00 A.M.,
in Tamil & Telugu Language - 2.00 A.M.

**and**

Tamil & English Message & Prayer

**Sunday 8.30 A.M. & 6.00 P.M.**

Please Subscribe if you are blessed! Share with whom you love & care!!

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## *from your dearly beloved brother...*





**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
EX ADMINISTRATOR
Sis. Jesy Veena Sam
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Sis. Sajini Cherian
Rev. Dr. J. John Rajarathnam, B.E.S., B.D., M.Th.
Rev. Dr. K.R. Rajasekaran
Adv. N. Balaji, B.Com., M.L.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293
Cell : (+91) 98410 71852, 98412 71858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call


**"මේ වතාවේ පමණක් ඔවුන්ට දැනගන්නට සලස්වන්නෙමි. මාගේ හස්තයත් මාගේ පරාක්‍රමයත් දැනගන්ට සලස්වන්නෙමි; මාගේ නාමය නාමයන් වහන්සේ බව ඔහු දැනගන්නෝය."**

**(යෙරමියා 16:21)**

ස්වාමීන්වහන්සේ තුළ ප්‍රිය ප්‍රේමවන්තයෙනි,

දෙවියන්වහන්සේ විසින් කැඳවනු ලැබූ සහ ලෝකයේ විවිධ රටවල් තුල ජීවත්වන අපගේ ආදරණීය සහෝදර සහෝදරියන් ගැන සිතීම සහ ඔවුන්ට ආචාර කිරීම කොතරම් මහත් ප්‍රීතියක්ද! දුර, භාෂාවන් හෝ තත්ත්වයන් නොසලකා ස්වාමීන් වහන්සේ තුළ එක්සත් වීමේ වරප්‍රසාදය ගැන අපි බෙහෙවින් කෘතඥ වෙමු.

**නිහතමානී ආරම්භයක්**

ඔව්, ඒ සියල්ල නිහතමානීව ආරම්භ වූයේ අගෝස්තු මස 10 වන දින නෙයියූර් CSI, දේවස්ථානයේ නෙල්ලරයිකෝණම් නම් කුඩා ගම්මානයේය.



එය ආරම්භ වූයේ, ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නොමැතිව විනාශයට පත්වෙමින් සිටින සහ සදාකාලික විනාශය කරා ගමන් කරන මිනිසුන් හා කාන්තාවන් පිළිබඳව අවංක බරක් සහ දැක්මක් ලැබූ තරුණ තරුණියන් පිරිසක්ගෙනි.

මා තරුණයෙක්ව සිටියදී මෙය සිදුවිය, අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අමිල වූ රුධිරය වගුරුවමින් කල්වාරි කන්දේදී අප උදෙසා උන්වහන්සේගේ ජීවිතය පූජා කිරීම පිළිගෙන උන්වහන්සේගේ කැඳවීමට කීකරුව හා යටහත්වූනාවූ තරුණයින්ගේ ජීවිත වලට දෙවියන් වහන්සේ සැබැවින්ම ගෞරවය කරනු ලැබුවේය.

වසර ගණනාවක් ගෙවී යත්ම, එම නිහතමානී ආරම්භය උන්වහන්සේගේ 'කැඳවීමේ ප්‍රතිරාවය' බවට පත්විය. එය දෙවියන්වහන්සේ විසින් දෙන ලද නමක් යැයි අපි විශ්වාස ක? කරමු. ඉන්දියාව, ශ්‍රී ලංකාව, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, ඔස්ට්‍රලියාව දකුණු අප්‍රිකාව, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ස්කොට්ලන්තය, ලන්ඩන් සහ එක්සත් රාජධානියේ අනෙකුත් ප්‍රදේශ ඇතුළු ඉන් ඔබ්බට ලෝකේ බොහෝ දේශවලට මෙම සේවයේ එහි පියාපත් විහිදුවා ලීමට ස්වාමීන් වහන්සේගේ කරුණාවෙන් හැකියාව ලබා දී ඇත.

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සැබවින්ම ශ්‍රේෂ්ඨ නොවේද?

ස්වාමීන්වහන්සේ අපට අපගේ පියාපත් විහිදුවාලීමට පමණක් නොව, විවිධ දේව සේවයන් හරහා දහස් ගණනක් ජනතාවට මෙම දේව සේවය ආශිර්වාදයේ මූලාශ්‍රයක් බවට පත්කර ඇත.

භාෂා 16කින් ප්‍රකාශයට පත්කරන ලද කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව
ඃ භාෂා තුනකින් පවත්වාගෙන යනු ලබන නෙහෙමියා බයිබල් විද්‍යාලය
ඃ ග්‍රාමයේ ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වාගෙන යනු ලබන ශාන්ත පාවුළු මෙට්ට්‍රිකියුලේෂන් උසස් පාසල.
ඃ භාෂා 2කින් පවත්වාගෙන යනු ලබන තැපැල් මාර්ගික පාඨමාලාව.
ඃ භාෂා තුනකින් පවත්වාගෙන යනු ලබන බයිබල් පාඨමාලාව
ඃ බහුභාෂා මිෂනාරි සේවාවන්.
ඃ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය.
ඃ පුහුණු වැඩසටහන්. ඃ සමාජ සේවා.
ඃ දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ දියුණුව සඳහා භාරගත් තවත් බොහෝ දේව සේවාවන්.

## අඩක් මියැදුණු මිනිසෙක්



අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පවසමින්; යෙරුසලමේ සිට යෙරිකෝව දක්වා ගමන් කරමින් සිටි මිනිසෙකු සොරු රැලකට හසුවුණේය. ඔවුන් ඔහුගේ වස්ත්‍ර ගලවා දමා ඔහුට තුවාල කොට පාර අයිනේ දමා ගිය අතර ඔහු අඩක් මිය ගොස් තිබුණි. එහෙත් කතාව එතැනින් අවසන් වූයේ නැත. ඒ අසලින්

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

ගමන් කළ යහපත් සමරිතානු වරයෙකු ඔහුව දැක ඔහුට අනුකම්පා කොට ඔහු සිටි ස්ථානයට පැමිණ ඔහුගේ තුවාල බැඳ ඔහුට සාත්තු කළේය.

ඒ ආකාරයට ආත්මිකව තුවාලව, කැඩී බිඳී, නොසලකා හරින ලද සහ බලාපොරොත්තුවක් නොමැතිව සිටින අය වෙත ළඟාවීමේ වගකීම ස්වාමීන් වහන්සේ අපට භාරදී ඇත. මෙම කැඳවීම සමග අතිවිශාල බරක් සහ මහත් වගකීමක් ද බැඳී පවතී.

**බර සහ සටන**

මෙම අවස්ථාවේදී අපගේ උරහිස්මත පැටවී ඇති බරෙහි විශාලත්වය සහ පරිපාලන වගකීම් ඔබ තේරුම් ගන්නවාට අප කැමැත්තෙමු.

බොහෝ අවස්ථාවන්වලදී දෙවියන්වහන්සේ අපට භාරදී ඇති සියල්ලේ බර අපට සැබැවින්ම දැනේ. එසේම සෑම කාලයකදීම උන්වහන්සේ අපට උපකාර කරයි. අපව ශක්තිමත් කරයි. අප මුහුණ දෙන විවිධ දුෂ්කරතාවයන් හරහා අප සමග ගමන් කරයි.

අප සතුරාගේ අභියෝග වලට මුහුණ දෙන්නෙමු. විශේෂයෙන් අපගේ ශුභාරංචි සේවයට විරුද්ධව තිබෙන ස්ථානවල සේවය කරන විටදී, සත්‍යයට විරුද්ධ වන අයගෙන් අපට රෝගයන්, මූල්‍යමය පීඩන, බලාපොරොත්තු සුන්වීම්, අනාරක්ෂිත බව සහ දුෂ්කරතා අත්විඳිය හැකිය. සමහර අවස්ථාවන්වලදී ගමනේ වෙහෙසද දැනෙන්නට ද පුළුවන.

එහෙත් මේ සියලු තත්ත්වයන්ට වඩා අපි අපගේ ඇදහිල්ල මත ස්ථිරව සිටින අතර අපව රැක බලා ගනිමින් අපව ශක්තිමත් කරමින් සහ අපට මග පෙන්වමින් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සෑම තත්ත්වයකදීම අප සමග සිටින බව ප්‍රකාශ කරමු.

ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ රුධිරය තුළින් සහ දෙවියන්වහන්සේ අපට දී ඇති සාක්ෂිය තුළින් අප අපගේ සතුරාට එරෙහිව ජයග්‍රහණය ලබා ගනිමු.

*"ඔවුහු බැටළු පැටවාණන්ගේ ලේ නිසාද තමුන්ගේ සාක්ෂියේ වචනය නිසාද ඔහුගෙන් ජයගත්තෝය; ඔවුහු මරණය විඳින තරමට පවා තමුන්ගේ ජීවිතයට ප්‍රේම නොකර සිටියෝය."(එළිදරව්ව 12:11)*

දේව සේවයේදී බොහෝ සටන්වලට මුහුණ දීමට සිදුවන නමුත් අපගේ විශ්වාසය ස්වාමීන් වහන්සේ තුළ පවතී. අපව කැඳවූ තැනැත්ත වහන්සේ විශ්වාසවන්තව සිටියි. උන්වහන්සේගේ අරමුණට අනුව අපව ඉදිරියට මෙහෙයවනු ඇතැයි අපි උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබමු.

**අපට ඔබගේ හවුල්කාරීත්වය අවශ්‍යයි!**

අවසාන වශයෙන් දෙවියන් වහන්සේ අපට භාරදී ඇති දර්ශනය ඊළඟ මට්ටමට ගෙනයාමට අප උත්සාහ දරන විටදී ඔබගේ හවුල්කාරීත්වය අපට සැබවින්ම අත්‍යාවශ්‍ය වෙයි.

ඇත්ත වශයෙන්ම අපි අසාර්ථකත්වයන්, අන්තරායන්, මූල්‍යමය අවශ්‍යතාවයන් සහ තවත් බොහෝ අභියෝගයන් වලට මුහුණ දෙමු. එමනිසා අපට අවශ්‍ය වන්නේ, යාච්ඤාවෙන් අප සමග එක්ව සිටමින් මෙම උතුම් රාජ්‍ය මෙහෙවරට සහාය දක්වන දෙවියන් වහන්සේගේ පුරුෂයන් හා ස්ත්‍රීන්ය.

ස්වාමීන්වහන්සේ ඔබට මගපෙන්වන විටදී ඔබ අප වෙනුවෙන් යාච්ඤා කර ඔබගේ උපකාරයේ හස්තය දිගුකරනවාද?

ඔබගේ යාච්ඤාවන්, දිරිගැන්වීම්, සහයෝගීතාවයන් සහ ප්‍රායෝගික සහය අපිට බෙහෙවින් වටින්නේය. එසේනම් එක්ව ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගැලවීමේ පණිවිඩය ඇසීමට අවශ්‍ය අයට ශුභාරංචිය රැගෙන යමු.

**දෙවියන්වහන්සේ ඔබට බහුල ලෙස ආශිර්වාද කරයි!**

*In Christ Jesus, your servant,* *Pr. S. Sam Selva Raj*

E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

*උත්පත්ති 1:14 හි* සඳහන්ව ඇති ආකාරයට අන්ධකාරයෙන් වැසී ගිය, හැඩයක් නොමැති, හිස් ලෝකයක් ඉදිරිපත් කරයි. එහෙත් එම කතාවේ අවසානය අන්ධකාරය නොවෙයි. දෙවියන්වහන්සේ කතා කළ විට ආලෝකය අන්ධකාරයට කඩා වැදුණි.

*''දෙවියන් වහන්සේ එළිය වේවායි කී සේක එවිට එළිය විය." (උත්පත්ති 1:3)*

අපගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේ සම්බන්ධ ක්‍රියාවන් කෙතරම් බලගතු චිත්‍රයක්ද!

ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැමිණියේ අවුල් සහගත, ව්‍යාකූල, පාපය සහ හෙලා දැකීමෙන් පිරුණා වූ ලෝකයකටයි. උන්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම තුළින් උන්වහන්සේ නව ජීවිතය, බලාපොරොත්තුව, මිදීම සහ ගැලවීම ගෙනාවේය.

අන්ධකාරය පැවති තැන, දෙවියන් වහන්සේ ආලෝකය පහළ කළ සේක.

ඒ හා සමානවම, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ආලෝකය අපගේ ජීවිත තුළට ගෙන එන විට, අවසාන තීරණය අඳුරට අයිති නොවේ.

අපගේ පවුල් සඳහා බලාපොරොත්තුවක් තිබේ.
අපගේ දරුවන් සඳහා බලාපොරොත්තුවක් තිබේ.
අපගේ විවාහයන්ට බලාපොරොත්තුවක් තිබේ.
අපගේ සේවාවන්වලට බලාපොරොත්තුවක් තිබේ.
අපගේ අනාගතයට බලාපොරොත්තුවක් තිබේ.

තත්ත්වයන් කෙතරම් අඳුරු ලෙස පෙනුණත් දෙවියන් වහන්සේගේ වචනයට සියල්ල වෙනස් කළ හැකිය.

## දෙවියන්වහන්සේ ආලෝකයයි. අපට බැබළීමට කැඳවීමක් ලැබී ඇත!

***යොහාන් 1:1-5 අපව නැවත ආරම්භයට ගෙන යන අතර ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සදාකාලික අනන්‍යතාවය හෙළි කරයි.***

*''උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය. ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය. ආලෝකය අන්ධකාරයෙහි බබලයි. අන්ධකාරයද එය ග්‍රහණය නොකෙළේය." (යොහාන් 1:4-5)*

ප්‍රේරිතවූ යොහාන් තුමා මෙසේ ප්‍රකාශ කරයි: *''.......දෙවියන්වහන්සේ ආලෝකය බවත්, උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්ය. (1 යොහාන් 1:5)*

නමුත් ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයකු වීම ගැන අසාමාන්‍ය දෙයක්ව තිබේ.

ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේම මෙසේ පැවසූ සේක. *''නුඹලා ලෝකයේ ආලෝකයය ........'' (මතෙව් 5:14)*

මොහොතක් නතර වී ඒ ගැන සිතන්න.

ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ලෝකයේ ආලෝකයය.

තවද දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ මේ ලෝකයේ උන්වහන්සේගේ ආලෝකය බබළවන පිණිසයි.

මෙය කෙතරම් ඇදහිය නොහැකි දෙයක්ද?

අප ආලෝකයේ ප්‍රභවය නොවේ. අපව කැඳවනු ලබන්නේ; උන්වහන්සේගේ ආලෝකය පරාවර්තනය කිරීමටයි. ආලෝකය අප තුළ ඇති නොවේ. එය ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් පැමිණෙන අතර කැප වූ ජීවිත තුළින් එය බබලයි.

දෙවියන්වහන්සේ සාමාන්‍ය මිනිසුන් භාජන ලෙස යොදා ගැනීමට තෝරාගෙන ඇති අතර ඔවුන් හරහා උන්වහන්සේගේ අසාමාන්‍ය ආලෝකය දැකිය හැකිය. ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ඉඩ දෙන විට ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සහ අප තුළින් ක්‍රියා කිරීමට අපගේ වචන අපගේ ක්‍රියාවන් අපගේ චරිතය සහ අපේ ජීවිතයට ප්‍රතිචාර දක්වන ආකාරය තුළින් අන් අයට උන්වහන්සේගේ දර්ශනයක් ලබා ගැනීමට හැකිය.

මෙම අඳුරු ලෝකයේ ආලෝකයේ නියෝජිතයන් ලෙස දෙවියන්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද?

## 1). අන්ධකාරය හරහා ආලෝකය බබලයි!

***"ආලෝකය අන්ධකාරයෙහි බබලයි; අන්ධකාරයද එය ග්‍රහණය නොකළේය." (යොහාන් 1:6)***

ආලෝකයේ පළමු හා වඩාත්ම පැහැදිලි ලක්ෂණය මෙයයි. ආලෝකය බලයි.

අන්ධකාරයේ ආලෝකය වඩාත් පැහැදිලිව බබලන්නේ කොහේද?

දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ සෑම දෙයක්ම දැනටමත් දීප්තිමත් හා සුවපහසු ස්ථානවලට නොවේ. උන්වහන්සේගේ ආලෝකය අප තුළින් එළිදරව් කළ හැකි වන පරිදි උන්වහන්සේ බොහෝ විට අපව අන්ධකාරය. පවතින ස්ථානවලට යවයි.

සමහරවිට අප අවධානය දිනා ගැනීමට ආශා කරමු. අපි සුවපහසු වටාපිටාවක්, හිතකර තත්ත්වයන් සාමකාමී සබඳතා සහ සැහැල්ලු කාලයන් ප්‍රාර්ථනා කරමු.

නමුත් වඩාත්ම දුෂ්කර යැයි පෙනෙන ස්ථානය අන්ධකාරය මධ්‍යයේ විය හැකිය. දෙවියන්වහන්සේ අපව වඩාත් බලවත් ලෙස භාවිතා කිරීමට අදහස් කරන ස්ථානය එයයි.

සමහරවිට දෙවියන් වහන්සේ ඔබව දුෂ්කර රැකියා ස්ථානයක තබා ඇත. සමහර විට ඔබ ඔබගේ පවුල තුළ අභියෝග වලට මුහුණ දෙනවා විය හැකිය.

සමහරවිට ඔබ ඔබේ දේව සේවයේ දුෂ්කර කාලයන් ගත කරනවා විය හැකිය.

සමහර විට ඔබේ අනාගතය පිළිබඳව අවිනිශ්චිත භාවයකට මුහුණ දෙනවා විය හැකිය. එවැනි ස්ථාන හෙලා නොදකින්න.

දෙවියන්වහන්සේ ඔබගේ ආලෝකය දීප්තිමත් ලෙස බබලන්නට කැමති ස්ථානය එය විය හැකිය. ***මීකා 7:8*** හි මෙසේ පවසයි;

"..... මා අඳුරෙහි හිඳින කල ස්වාමීන් වහන්සේ මට එළියක්ව සිටින සේක." අපට අන්ධකාරයෙහි වාඩි වීමට සිදුවන කාලවකවානු තිබිය හැකි නමුත් එහිදී පවා දෙවියන්වහන්සේ අපගේ ආලෝකය ලෙස සිටියි.

***ගීතාවලිය 18:28 හි මෙසේ කතා කරයි;***

***"එසේය, ඔබ මාගේ පහන දල්වන සේක, මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ මාගේ අන්ධකාරය ආලෝක කරන සේක."ගීතාවලිය 23:4 හි මෙසේ මතක් කර දෙයි;***

***"එසේය මරණ සෙවනේ මිටියාවත මැදින් යන්නෙම් නමුත් කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි."*** මගේ ආදරණීය සහෝදර සහෝදරිය, අද ඔබ අන්ධකාරයෙන් වට වී සිටින බවක් දැනේනම් අධෛර්යමත් නොවන්න. දෙවියන් වහන්සේ ඔබ සමඟයි. ඔබ නිම්නය හරහා ගමන් කරනවා විය හැකිය. නමුත් ඔබ ඒ හරහා තනිවම ගමන් කරන්නේ නැත.

මෙය මතක තබාගන්න: අප විසින්ම අඳුරට පත්වීමෙන් අපි අඳුර ජය නොගනිමු. අඳුරු කාමරයක ආලෝකයක් දැල්වූ විට අන්ධකාරය භෞතිකව ඉවත් කළ යුතු නැත. ආලෝකය ඉදිරියේ එය නිනැතින්ම අතුරුදහන් වෙයි.

අඳුර ආලෝකයට ඉඩ දිය යුතුයි.

එබැවින් බැබලෙන්න!

## 2). අන්ධකාරයට ආලෝකය ජය ගත නොහැක!

අන්ධකාරය බලවත් ලෙස පෙනෙන්නට පුළුවන. එය බිය උපදවන ලෙස පෙනෙන්නට පුළුවන. එය අනාගතය අවිනිශ්චිත කර අප තුළ බියක් ඇති කළ හැකිය.

නමුත් අන්ධකාරයට සීමා කිරීමක් ඇත.

එයට ආලෝකය ජයගත නොහැකිය.

***යොහාන් 1:5 මෙසේ ප්‍රකාශ කරයි;***

***ආලෝකය අන්ධකාරයෙහි බබලයි. අන්ධකාරයද එය ග්‍රහණය නොකළේය."***

....Contd. to page 6





ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ඔක්:19 -** 2026 අගෝස්තු මස 10 වන දින කැඳවීමේ ප්‍රතිරාවය සේවය 58 වන වසරට පා තැබීමට හා සම්මේලන වැඩසටහන පැවැත්වීමට අපට උන්වහන්සේගේ කරුණාවෙන් ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ඔක්:20-** දෙවියන් වහන්සේගේ සැපයීම හා කරුණාව නිසාත් අනෙකුත් සියලු සේවාවන් වලට සහයෝගය දැක්වීමට අපට හැකි වූ නිසා, ස්තුති කරන්න.

**ඔක්:21 -** 1969 වර්ෂයේ සිට කැපවීමෙන් පවත්වාගෙන පැමිණි සඟරා සේවයට දෙවියන්වහන්සේ ඉතා විශ්වාසවන්තව බලවත් ලෙස ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ඔක්:22-** අපගේ සභා සේවකයින්ට සහ සේවා හවුල්කරුවන්ටත් ඔවුන්ගේ පවුල්වලටත් උන්වහන්සේ බලවත් ලෙස ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ඔක්:23 -** දෙවියන්වහන්සේගේ කරුණාව සහ මග පෙන්වීම නිසා ශුභාරංචිය ළඟානොවූ ප්‍රදේශවලට ඇතුළු වීමට අපට හැකියාව ලැබුණු නිසා, ස්තුති කරන්න.

**ඔක්:24-** අපගේ ප්‍රධාන සභාවට සහ ශාඛා සභාවන් වල සහයෝගීතාවයට තවත් ඇදහිලිවතුන් එකතු කරමින් ආශිර්වාද කළ නිසා, නිසා ස්තුති කරන්න.

**ඔක්:25-** අගෝස්තු මස 15 වන දින මහා බලිපුරම්හි යේසුස් මිෂන් දේවස්ථානයේ පැවැති විශේෂ පිරිමි රැස්වීමටත් අපගේ ප්‍රධාන දේවස්ථානයේ පැවැති කාන්තා දේව සේවයටත් ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ඔක්:26-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විද්‍යාලය සහ දේවධර්ම තැපැල් මාර්ගික පාඨමාලාව සඳහා උන්වහන්සේ ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ඔක්:27-** දේවගැති එස්. සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ අයට උන්වහන්සේගේ බලවත් ආශිර්වාදය ලැබී තිබුණ නිසා, ස්තුති කරන්න

**ඔක්:28-** පසුගිය මාසය පුරාවටම අපගේ සියලුරුම මූල්‍යමය හා අධ්‍යාත්මික අවශ්‍යතා සපුරා ලීමට උන්වහන්සේ විශ්වාසවන්ත වූ නිසා, ස්තුති කරන්න

**ඔක්:29 -** අපගේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට උන්වහන්සේ ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ඔක්:30-** ලොව පුරා සිටින මනුෂ්‍යයෙන් සහ සියලුරු ජාතීන් කෙරෙහි උන්වහන්සේගේ ආරක්ෂාව, දයාව සහ කරුණාව ලැබුණ නිසා, ස්තුති කරන්න.

**නොවැ:01-** ලොව පුරා සුභාරංචි සේවය ගෙනයාමට දෙවියන් වහන්සේ බොහෝ දොරවල් විවෘත කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**නොවැ:02** ශ්‍රී ලංකා දේශය තුළ කිතුණු නිකායන් එකමුතුවන් ක්‍රියා කිරීමට උපකාර කළ නිසා, ස්තුති කරන්න.

**නොවැ:03-** ශ්‍රී ලංකා දේශයේ ආර්ථිකයට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**නොවැ:04-** මත්පැන් සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමෙන් ළමුන් සහ තරුණයින් ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:05-** කැඳවීමේ ප්‍රතිරාවය සඟරා සේවයේ ක්‍රියාකාරීව සේවය කරන සියලු දෙනාගේ සෑම අවශ්‍යතාවයක්ම සපයන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:06-** අපගේ සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විදුහලේ සිසුන්ගේ විනය, කැපවීම සහ අධ්‍යාත්මික වර්ධනය උදෙසා, යාච්ඤා කරන්න.

**නොවැ:07-** ස්වභාවික විපත්වලින් සියලුරු මනුෂ්‍යයන්ට ආරක්‍ෂාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:08-** සියලු ජාතීන් හා රටවල් අතර සාමය සහ සමගිය ඇතිවන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:09-** ලොව පුරා සිටින සියලුම ජනතාවගේ යහ පැවැත්ම සහ ආරක්‍ෂාව පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:10-** දෙවියන්වහන්සේගේ කරුණාව කරණකොට ගෙන ඉන්දියාව පුරා ශුභාරංචිය ළඟා නොවූ කණ්ඩායම් වෙතට යාමට හැකි බලය ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:11 -** අපගේ ප්‍රධාන දේවගැති තුමා වන එස්. සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ අයට යහපත් සෞඛ්‍යයත් ශක්තියත් දෙවියන්වහන්සේගේ ආරක්‍ෂාවත් ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:12-** ලොව පුරා පවතින ළමා ජාවාරම් ළමා අපචාර සහ අවදානම් වලට ලක්විය හැකි දරුවන්ටට ආරක්ෂාව සහ ඔවුන්ගේ ප්‍රතිසංස්කරණය පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:13 -** සියලුම කිතුණු සංවිධාන සහ සභාවන් කෙරෙහි දෙවියන්වහන්සේගේ ආශිර්වාදය සහ ආරක්ෂාව පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:14-** යේසුස් වහන්සේගේ ජීවිත ආදර්ශයත් සමගම කිතුණු දේව සේවයන් තුළින් බලවත් ප්‍රාතිහාරයන් සහ අරුම පුදුම දේ සිදුවන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:15-**-දේව දරුවන්ගේ හදවත් සහ ඔවුන්ගේ ඇස් ආලෝකමත් වීමට ඔවුන්ට අවශ්‍ය අධ්‍යාත්මික අවබෝධය සහ ප්‍රඥාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:16-**- ලෝකය පුරා පවතින ස්වභාවික විපත් හා යුද්ධය නිසා දුක් විඳින ජනතාවට දෙවියන්වහන්සේගේ කරුණාවත් සැපයීමත් ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:17-**- ශ්‍රී ලංකා දේශය තුළ සිටින පාසැල් දරුවන් මත්පැන්, මත්ද්‍රව්‍ය හා තාක්ෂණය තුලින් ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**නොවැ:18-**- ශ්‍රී ලංකා දේශය තුළ තිබෙන කිතුණු සභාවන් වල එකමුතුකම සහ ආත්මික වර්ධනය ඇතිවන පිණිස, යාච්ඤා කරන්න.

....Contd. from page 4

කාමරයක් කොතරම් අඳුරු වුවත් එහි ආලෝකය ඇතුළු වූ විගස අන්ධකාරයේ ආධිපත්‍යය නැති කර ගනී.

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපව කැඳවා අත්තේ ලෝකයේ ආලෝකය වීමටයි. එහෙත් අපගේ ජීවිතයේ සමහර අවස්ථාවන් වලදී අප වටා ඇති සියල්ල මත සෙවනැල්ලක් දමන බවට පෙනෙන්නට පුළුවන.

එය වෛද්‍යවරයෙකුගේ වාර්තාවක් වෙන්නට පුළුවනි.
එය රජයේ තීරණයක් වෙන්නට පුළුවනි.
එය පවුලේ අමාරු තත්ත්වයක් වීමට පුළුවනි.
එය මූල්‍යමය පීඩනයක් විය හැකිය.
එය ප්‍රතික්ෂේප කිරීමක් විය හැකිය.
එය තනිකමක් විය හැකය.
එය ව්‍යාකූලත්වයේ, අවිනිශ්චිත භාවයේ හෝ හෝ අනාගතය පිළිබඳ බියක් විය හැකිය.

නමුත් මෙය පැහැදිලිව අසන්න:
*අන්ධකාරයට අවසාන වචනය නැත යන්නයි.*

අප ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ සම්බන්ධව සිටින විට අප අපගේ ආලෝකයේ ප්‍රභවය සමඟ සම්බන්ධව සිටිමු.

පහනේ බල ප්‍රභවය විසන්ධි වූ විට එය දිගටම බැබලෙන්නේ නැත. එලෙසම ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය සීතල වීමට හෝ දුරස් වීමට ඉඩ දුන්නහොත් අපට එලදායි ලෙස බැබලෙන්නට නොහැකිය.

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය වැදගත් වන අතර එය අපගේ ශක්තියයි.

අපගේ යාච්ඤා ජීවිතය වැදගත් වෙයි.

දෙවියන්වහන්සේගේ වචනය සමඟ අපගේ සම්බන්ධතාවය වැදගත් වෙයි. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය වැදගත් වෙයි. ශුද්ධාත්මයාණන් කෙරෙහි අපගේ යැපීම වැදගත් වෙයි.

සතුරා අපව මූලාශ්‍රයෙන් විසන්ධි කිරීමට කැමති වනු ඇත. මන්ද ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් විසන්ධි වූ ඇදහිලිවන්තයෙකු ආත්මික කාර්යක්ෂමතාවයෙන් බැබලීමට අරගල කරන බව ඔහු දන්නා බැවිනි.

නමුත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටින විට උන්වහන්සේගේ ආලෝකය අපි තුළින් බබලයි.

***එබැවින් අප ඇදහිල්ලෙන් මෙසේ ප්‍රකාශ කරමු;***

අන්ධකාරයට මගේ සිතුවිලි කෙරෙහි බලයක් නැත.
අන්ධකාරයට මගේ අනාගතය කෙරෙහි බලයක් නැත.
අන්ධකාරයට මගේ පවුල කෙරෙහි බලයක් නැත.
මගේ කැඳවීම කෙරෙහි අන්ධකාරයට බලයක් නැත.
මගේ සේවය කෙරෙහි අන්ධකාරයට බලයක් නැත.

මා තුළ සිටින ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මට බැබලීමට හැකියාව ලබා දෙන ආලෝකයයි. ආමෙන්!

## 3). මෙම කාල කාලවකවානුව තුල අපට බැබලීමට කැඳවීමක් ලැබී තිබේ!

***ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ පවසයි; "නුඹලා ලෝකයේ ආලෝකයය...."(මතෙව් 5:17)***

සියල්ල හොඳින් සිදුවන විට සහ ඔබේ තත්ත්වයන් වාසිදායක වූ විට 'ඔබ ලෝකයේ ආලෝකයයි' යනුවෙන් ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නොකිවූ බව සලකන්න.

තත්ත්වයන් හිතකර වූ විට පමණක් බැබලීමට අපට කැඳවීමක් නොමැත.

සෑම වකවානුවකම බැබලීමට අපව කැඳවනු ලැබේ.

පරිපූර්ණ සමයක් කිසිදා නොතිබිය හැකිය. පරිපූර්ණ තත්ත්වයන් කිසිදා නොතිබිය හැකිය. සම්පූර්ණයෙන්ම හිතකර පරිසරයක් කිසිදා නොතිබිය හැකිය.

එහෙත් අපි බැබලෙන්නට පටන් ගැනීමට පෙර අන්ධකාරය අතුරුදහන් වනතුරු බලා සිටීමට දෙවියන් වහන්සේ අපව කැඳවා නොමැත.

අන්ධකාරය මධ්‍යයේ බැබලීමට අපව කැඳවා ඇත.

යොහාන් 3:19 අපට මතක් කර දෙන්නේ; ***"ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නුමුත් මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය."*** එමනිසා ආලෝකයේ ගමන් කිරීමට තෝරා ගැනීම සමහර විට අප අවට ලෝකයෙන් වෙනස් වීමට හේතුවක් විය හැකිය.

එය සෑම විටම ජනප්‍රිය නොවිය හැකිය.
එය සෑම විටම තේරුම් නොගත හැකිය.
එය සමහර විට අපව අපහසුතාවයට පත් කරයි.

නමුත් අප වටා ඇති අන්ධකාරයට අනුගත වීමට අපව කිසිවිටෙකත් කැඳවනු ලැබුවේ නැත.

අපව කැඳවා ඇත්තේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය රැගෙන යාමටයි.

අපගේ කැඳවීම අන්ධකාරයට මිශ්‍රවීම නොව එය ආලෝකමත් කිරීමයි.

එය සෑම විටම ජනප්‍රිය නොවිය හැකිය.
එය සෑම විටම තේරුම් නොගත හැකිය.
එය සමහර විට අපව අපහසුතාවයට පත් කරයි.

නමුත් අප වටා ඇති අන්ධකාරයට අනුගත වීමට අපව කිසිවිටෙකත් කැඳවනු ලැබුවේ නැත. අපව කැඳවා ඇත්තේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය රැගෙන යාමටයි. අපගේ කැඳවීම අන්ධකාරයට මිශ්‍රවීම නොව එය ආලෝකමත් කිරීමයි.

## 4). දෙවියන් වහන්සේ අන්ධකාරයෙන් ආලෝකය වෙන් කළේය - වෙන්වීමේ ජීවිතයක්!

*උත්පත්ති 1:3 -4 හි මෙසේ පවසයි;*

***"දෙවියන් වහන්සේ එළිය වේවයි කී සේක: එවිට එළිය විය. එළිය යහපත් බව දෙවියන් වහන්සේ දුටු සේක. දෙවියන්වහන්සේ අන්ධකාරයෙන් එළිය වෙන් කොට ...."***

අනුපිළිවෙල සැලකිල්ලට ගන්න.

දෙවියන්වහන්සේ අඳුර මැද ආලෝකය ඇතිවන ලෙස වදාළ සේක. ඉන්පසු උන්වහන්සේ ආලෝකය අඳුරෙන් වෙන් කළ සේක.

සෑම ඇදහිලිවන්තයෙකුටම මේ තුළින් ගැඹුරු පණිවිඩයක් ගෙන එයි.

දෙවියන්වහන්සේ අපව කැඳවා ගෙන ඇත්තේ බැබලීමට පමණක් නොව වෙන්වීමටත්ය.

අඳුර හිතාමතාම වැළඳගනිමින් අපට ආලෝකය එලදායී ලෙස නියෝජනය කළ නොහැක.

වෙනසක් තිබිය යුතුමයි.

ශුද්ධකම තිබිය යුතුමයි.

අප ජීවත්වන, කතා කරන, සිතන, ක්‍රියා කරන, අන් අයට සලකන, තීරණ ගන්න සහ හැසිරෙන ආකාරයෙන් දෘෂ්‍යමාන වෙනසක් තිබිය යුතුමයි.

අපගේ ජීවිතය අප නියෝජනය කරන තැනැත්තාව පිළිබිඹු කළ යුතුය.

යෙසායා 42:6 - 7 දක්වා පද තුළ දෙවියන් වහන්සේ තම සෙනඟව කැඳවා තිබෙන්නේ කුමකටද කියා ප්‍රකාශ කරයි;

***''.....ජාතීන්ගේ එළියක්ද කොට නියම කරන්නෙමි....''***

අපට භාරදී තිබෙන ආලෝකය අපගේ ජීවිතවල සීමාවන් තුළ පමණක් රැඳී සිටීම මෙයින් අදහස් නොකරයි.

අපගේ නිවෙස් ආලෝකය අත්විඳිය යුතුයි.

අපගේ සේවා ස්ථානය ආලෝකය අත්විඳිය යුතුයි.

අපගේ සභාව ආලෝකය අත්විඳිය යුතුයි.

අපගේ ප්‍රජාව ආලෝකය අත්විඳිය යුතුයි.

අපගේ පරම්පරාව ආලෝකය අත්විඳිය යුතුයි.

දෙවියන්වහන්සේ අපගේ පහන් දල්වා ඇත්තේ අපට ඒවා සැඟවීමට නොවේය. උන්වහන්සේ අපව බැබලීමට කැඳවා ඇත.

## 5). ආලෝකයේ ආයුධය පැළඳගන්න!

අවසාන වශයෙන් ***රෝම*** *13:12* අපට බලවත් අභියෝගයක් ලබාදෙයි;

"රාත්‍රිය බොහෝ සේ ඉකුත්ව ගියේය, දවාල ළඟය. එබැවින් අන්ධකාරයේ ක්‍රියා අහක දමා, ආලෝකයේ ආයුධ පැළඳ ගනිමු."

ශුද්ධ ලියවිල්ල භාවිතා කරන භාෂාව සැලකිල්ලට ගන්න:

"අන්ධකාරයේ ක්‍රියා පසෙකලා දමන්න."

"ආලෝකයේ ආයුධය පැළඳ පැළඳගන්න."

ආලෝකය යනු අප දකින දෙයක් පමණක් නොව, එය අපව පැළඳගෙන ජීවත් වීමට කැඳවා ඇතිදෙයකි.

ආලෝකයේ ආයුධය පැළඳීම යනු සම්මුතියක් වෙනුවට ධර්මිෂ්ටකම තෝරා ගැනීමයි.

*එහි තේරුම නම්;*

ඃ පාපයට වඩා ශුද්ධකම තෝරාගැනීම.

ඃ වංචාවට වඩා සත්‍ය තෝරා ගැනීම.

ඃ තිත්තකමට වඩා සමාව තෝරා ගැනීම.

ඃ බියට වඩා ඇදහිල්ල තෝරාගැනීම.

ඃ පහසුවට වඩා කීකරුකම තෝරාගැනීම.

ඃ මේ ලෝකයේ රටාවන් සහ වටිනාකම්වලට වඩා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තෝරා ගැනීම.

අප ආලෝකයෙහි ආයුධය පැළඳ ගත්විට අන්ධකාර ක්‍රියාවලට එරෙහිව ස්ථිරව සිටීමට අප සන්නද්ධ වෙමු.

## ඔබේ ආලෝකය බබළවන්න!

ආදරණීය සහෝදරවරුනි, ධර්මිෂ්ඨ පුද්ගලයෙකුගේ ජීවිතය පිළිබඳව ශුද්ධ වූ ලියවිල්ල අපට අලංකාර පොරොන්දුවක් ලබාදෙයි.

ඔබගේ ප්‍රජාවට ඔබගේ ආලෝකය අවශ්‍යයි.

ඔබගේ සභාවට ඔබගේ ආලෝකය අවශ්‍යයි.

....Contd. to page 9

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission!
Medium :Tamil (Part Time)
Hindi (Part Time)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 57 years
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

“…කියවන්නා තේරුම් ගනීවා….” (මතෙව් 24:15)

## අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකිවුලේෂන් පාසලේ ඉතිහාසය

මාගේ සේවයේ මුල් අවධියේදී විවිධ පාර්ශ්වයන්ගෙන් විරෝධතාවලට මුහුණ දීමට නිතරම මා හට සිදු විය; ඒ නිසා ස්වාමීන් වහන්සේගේ සේවයේ නිරතව සිටියදී මට මගේ නිවහන සහ කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙන යාමට සිදුවිය.

1978 වන වර්ෂයේදී, මා චෙන්නෙහි කුඩා නිවසක් කුලියට ගත් අතර සුපුරුදු පරිදි මා එහි පදිංචි වීමට පෙර මගේ දේවගැති තුමා වන පාලක ජී. සුන්දරම් (එවකට අපෝස්තලික ක්‍රිස්තියානි සභාවේ ප්‍රධාන දේවගැති) තුමාට මගේ නිවසට පැමිණ ආශිර්වාද කරන ලෙස ඉල්ලා සිටියෙමි. ඔහු තම සහකාර දේවගැති තුමා වන M.K. සුන්දරම්ව එවන ලදී. ඔහු ඉතා ප්‍රේමණීය හා ගෞරවනීය දෙවියන් වහන්සේගේ සේවකයෙකි. ඔහු චෙන්නෙහි අපෝස්තලික ක්‍රිස්තියානි සභාවේ වත්මන් ප්‍රධාන දේව ගැතිවරයායය.

එදින මා අතැතිව මුදල් ටිකක් තිබුන නිසා අප දෙදෙනාම ටැක්සියක නැග ගමන් කළෙමි. අප එම ටැක්සියට නැග්ග පසු පූජකතුමා ඔහුගේ දෙනෙත් පියාගෙන යාච්ඤාව කළේය. නමුත් මම අපගේ ගමන් ගාස්තුව පෙන්වන මීටරය දෙස බලාගෙන සිටියෙමි.

කාලය ගතවෙද්දී මීටරයේ පෙන්වා ඇති මුදල මගේ අතේ තිබුණු මුදලට ආසන්න විය. මිනිත්තු කිහිපයකින් මීටරයේ පෙන්වා ඇති මුදල හරියටම මගේ අතේ තිබූ මුදලට සමාන විය. අපට තවමත් බොහෝ දුරක් යා යුතුව තිබුණි. නමුත් මා සතුව තවත් මුදල් තිබුණේ නැත. මා සතුව තිබූ මුදලට වඩා වාහනයේ මීටරය දිව ගොස් හමාරය. වාහනය තවත් ඉදිරියට ගියොත් මා හට කරදරයකට පත්වේ යැයි මම බිය වූයෙමි. මා සමග ජ්‍යෙෂ්ඨ දේවගැති වරයෙක් සිටියේය. කුමක් කළ යුතුදැයි මම නොදනිමි. එබැවින් මම මගේ හදවතින්ම කෑ ගසමින්; ”අනේ ආදරණීය පියාණෙනි, මම කුමක් කරන්නද? මීට අමතරව මට කිසිදු මුදලක් ද නැත.” මට දහඩිය දැමීමටද පටන් ගත්තෙමේ. නමුත් වාහනය වේගයෙන් ඉදිරියටම ධාවනය විය.

පසුව මම මීටරය දෙස බැලූ විට එය හිරවී මා සතුව තිබූ මුදලේ ප්‍රමාණයටම වාහනය නතර වූ බව දුටු විට මම පුදුමයට පත්වුනෙමි. මගේ දෑස් වල කඳුළු පිරුණි.

අප අපගේ නිවසට පැමිණුනෙමු. පූජකතුමා ඒ ගැන කිසිම දෙයක් දැනගෙන සිටියේ නැත. අප කුලීරථයෙන් බැස්ස ක්ෂණිකව මම රියදුරාගේ අතින් අල්ලාගෙන; ”ප්‍රේමණීය සහෝදරය, මම ජීවමාන දෙවියන් වහන්සේගේ සේවකයෙක්, මගේ අතේ තියෙන්නේ මේ මුදල විතරයි. ඔබගේ වාහනයේ මීටරය මඟදී හිරවෙලා මා ළඟ තිබුණු මුදල පෙන්වනවා. කරුණාකරලා මට පැයක කාලයක් දෙන්න. එවිට අප ආවරණය කළ දුර ප්‍රමාණයට ඔබ ඉල්ලන මුදල මම ඔබට ලබා දෙන්නෙමි. කරුණාකර ගරු පූජකතුමනි මගේ ආගන්තුකයාට මේ ගැන කිසිවක් කියන්න එපා.”

එකෙනෙහිම රියදුරු මාව වැළඳගෙන, ”මමත් දෙවියන්වහන්සේගේ දරුවෙක්; දෙවියන් වහන්සේ මට ඔබට උදව් කිරීමට අවස්ථාවක් ලබා දුන්බව මම මුළු හදවතින්ම විශ්වාස කරනවා.”යනුවෙන් පැවසුවේය. එසේ පැවසූ පසු මා ඔහුට දුන් මුදල් නැවත මට ලබාදී; ”මෙය මගේ ආදරණීය පූජාවක් ලෙස කරුණාවෙන් පිළිගන්න. ඔබ මෙම මුදලින් කිරි මිලදී ගන්න. ඔබගේ නව නිවසට යන විටදී එය ඔබට උපකාරයක් වනු ඇත. මා නමස්කාර කරන ස්වාමීන් වහන්සේ ඔබව කෝටිපතියකු බවට පත් කරනවා.” ය යනුවෙන් පැවසීය ඔහු මෙසේ පවසා එතැනින් පිටව ගියේය. මගේ ජීවිතයේ පසු කාලීනවද කිසිවිටෙක මා ඔහුව දුටුවේ නැත.

මම කිරි රැගෙන පාලකතුමාට දුන්නෙමි මගේ අලුත් නිවසේදී ඒවා බොන්නට මා මහත් ආශාවෙන් සිටියෙමි. එදින පාලකතුමා ගායනා කළ ගීතය මගේ මතකයේ තවමත් රැඳී තිබේ. ඔහු ගායනා කරන විටදී මා මහත් හඬින් හඬන්නට පටන් ගත්තේය. ඔහු ගායනය නවත්වා; ”සහෝදර සෑම්, ඔබ මෙලෙස අඬන්නේ ඇයි?” කියා මගෙන් ඇසුවෙමි. මා ඔහුට සිදු වූ සෑම දේම පැවසුවෙමි. එය ඇසු විට ඔහුත් කඳුළු සලමින් මට මෙසේ පැවසුවේය; ”ඔබ මේ ගැන කරදර වෙන්නේ ඇයි? මගෙන් ඇසුවා නම් මම මුදල් දෙනවා කියා, ඔබ දන්නේ නැද්ද? ඒකට කමක් නැහැ, දෙවියන් වහන්සේ ඔබ සමඟයි. දහස් ගණන් මිනිසුන්ට ඉතා ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස දෙවියන්වහන්සේ ඔබව භාවිතා කරයි. ඔබ බිය වෙන්න එපා.”කියා ඔහු මට ආශිර්වාදය කර මගේ නිවසෙන් නික්ම ගියේය. ඒ දවසේදී මගේ නිවසේ සිටියේ අප දෙදෙනා පමණි.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, මෙම සිදුවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? ඔබගේ අත්දැකීම කුමක්ද? මාගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ජීවිතයේ තවත් ප්‍රාතිහාර්යයක් කරනු ඇත. උන්වහන්සේ කෙරෙහි පමණක් දැඩිව ඇලී සිටින්න!

*************

## 57TH ANNIVERSARY CELEBRATION - Special Guests



Sis. Padma Mudaliar, Sis. Jebakumari David, and Sis. Sheeba (Singer) were our special guests on these days.

God mightily used each of them to strengthen and edify the faith of those who attended the services, as well as those who watched the programmes through our YouTube channel, **Echo of His Call**.

We praise God for using them as instruments of blessing and encouragement to His people.

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Children School : 11.00 a.m. Sunday**
18. **Youth Meeting : 11.00 a.m. Sunday**
19. **Elders for Christ Meeting : 11.00 a.m. Sunday**
20. **Fellowship Lunch : 01.00 p.m. Sunday**
21. **Telugu Service : 4.00 p.m. Sunday**
22. **Hindi Service : 5.00 p.m. Sunday**
23. **Tamil & English Service : 6.00 p.m. Sunday**
24. Feedback Time : 8.00 p.m. Sunday
25. Women's Prayer : 5.30 p.m. Wednesday
26. Men's Prayer : 7.00 p.m. Friday
27. Discipleship Meeting : 6.00 p.m. Saturday
28. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
29. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
30. Workers Meeting : 5.30 p.m. First Saturday
31. Parents' Prayer : 4.00 p.m. First Sunday
32. Night Prayer : 9.30 p.m. Third Friday
33. Fasting Prayer : 9:30 a.m. Second Saturday
34. Holy Communion : Second Sunday Service
35. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
36. Staff Devotion : 9.00 a.m. daily
37. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

*....Contd. from page 7*

ඔබගේ ප්‍රජාවට ඔබගේ ආලෝකය අවශ්‍යයි.

ඔබගේ සභාවට ඔබගේ ආලෝකය අවශ්‍යයි.

සභා ගොඩනැගිල්ලේ දොරවල් හරහා කිසි දිනෙක ඇවිද යා නොහැකි අය සිටින නමුත් ඔබගේ ජීවිතය හරහා බැබලෙන ආලෝකය තුළින් ඔවුන්ට ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව හමුවිය හැකිය.

**එබැවින් ඔබගේ ආලෝකය නොසඟවන්න.**

ඔබගේ ඇදහිල්ලෙන් සමාව ඉල්ලන්න එපා. දුෂ්කර තත්ත්වයන් නිසා ඔබගේ සාක්ෂිය නිහඬ කිරීමට ඉඩ දෙන්න එපා.

ඔබගේ ආලෝකය නොවැදගත් බව අන්ධකාරය විසින් ඔබට ඒත්තු ගැනීමට ඉඩ දෙන්න එපා.

***දිගටම බැබලෙන්න!***

ඉන්දියාව පුරා සමරනු ලබන ආලෝක උත්සවය ගැන මෙනෙහි කරන විට, ඊටත් වඩා ශ්‍රේෂ්ඨ ආලෝකයක් ගැන සිහිපත් කරමු.

එය තාවකාලික ආලෝකයක් නොවේය.

එය නිවා දැමිය හැකි ආලෝකයක් නොවේය.

එය මිනිස් අත් වලින් නිපදවිය හැකි ආලෝකයක් නොවේය.

නමුත් ලෝකයේ ආලෝකය වන ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ; උන්වහන්සේ අපගේ අඳුරට පා තැබුවේය. උන්වහන්සේ අපගේ ඇස් අරිනු ලැබුවේය. උන්වහන්සේ අපට ගැලවීම ගෙන ආවේය.

උන්වහන්සේ පාපය සහ මරණය පරාජය කළේය.

දැන් උන්වහන්සේ අපට කතා කරමින්;

*"නුඹලා ලෝකයේ ආලෝකයය......" (මතෙව් 5:14)*

එනිසා අප අපගේ හදවත් පරීක්ෂා කරමින් මෙසේ අසා ගනිමු;

දෙවියන්වහන්සේ මට බැබලෙන්න කියා පවසන්නේ කුමන අන්ධකාරයටද?

මගේ ආලෝකයේ ප්‍රභවයට මම තවමත් සම්බන්ධව සිටිනවාද?

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

මගේ ජීවිතයේ ආලෝකයෙන් වෙන් කළ යුතු දෙයක් තිබෙනවාද?

කාලය දුෂ්කර වූ විටදී පවා මම බැබලීමට කැමතිද?

***අද, අපි තීරණයක් ගනිමු;***

මම බැබලෙන්නෙමි. මම ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ සම්බන්ධව සිටිමි.

මම ආලෝකයේ ඇවිදින්නෙමි.

මම අන්ධකාරයේ ක්‍රියා පසෙක ලා තබන්නෙමි.

මම ආලෝකයේ ආයුධය පැළඳ ගන්නෙමි.

මම ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය මගේ පවුලට, මගේ සභාවට, මගේ සේවා ස්ථානයට සහ මගේ ප්‍රජාවට රැගෙන යන්නෙමි.

මන්ද අන්ධකාරයට ආලෝකයෙන් ජයගත නොහැකිය. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප තුළ ජීවත් වන විට - අප බැබලීමට කැඳවනු ලැබේ.

***"නැගිට බැබළියන්න, මක්නිසාද නුඹේ ආලෝකය පැමිණුනේය. ස්වාමීන් වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය." (යෙසායා 60:1)***

බලාපොරොත්තු රහිත අයට බලාපොරොත්තුව ගෙන දෙමින්, බිඳුනු අයට සුවය ගෙන දෙමින්, නැති වූවන්ට මගපෙන්වමින් සහ උන්වහන්සේගේ නාමයට මහිමය ගෙන දෙමින් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය අප සෑම කෙනෙකු තුළින්ම දීප්තිමත් ලෙස බැබලේවා බැබලේවා! ආමෙන්.

************

## NOTICE

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846
Date of Publication: First week of every month
Date of Posting : 1st & 2nd of every month
Posted at "Egmore RMS Patrika Channel"
on 3rd OCTOBER 2026.

If un-delivered please return to:

ECHO OF HIS CALL (SINHALA)
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

**JESUS LOVES YOU!**

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**